ආයෝජනයට අත්වැලක්

පටුන

ඉතිරිය	02
ආදායම් වියදම් ගැන	06
ණය ගැනීම්	10
ණය ගැනීම් වර්ග සහ වැදගත් කරුණු	14
ආයෝජනය	16
ආරක්ෂණය	22

අපිට මූල්‍යමය මග පෙන්වීමක් අවශ්‍ය ඇයි?

ඔබ මහන්සියෙන් උපයන මුදල් හරි විදිහට වියදම් කරන්න. ඉතුරු කරන්න වගේම ආයෝජනය කරන්න, ඔබව දැනුවත් කරල ඔබට යහපත් හෙට දවසක් උදා කරන එක මේ පොත් පිංච ඔබට පිරිනමන එකේ අරමුණයි.

මූල්‍යමය විනයක් අපි තුල ඇතිකර ගන්නේ කොහොමද?

මුල්‍යමය විනය කියන්නේ සරල වචනයෙන් කියනව නම් සල්ලි හරියට පාවිච්චි කරන්නේ කොහොමද කියන එකයි. මේක ඇත්තටම ගොඩක් අමාරු දෙයක් නෙමෙයි. හැම දේම වගේම මේකත් හරියට පුරුදු පුහුණු වෙන්න ඕනේ.

ඔබගේ කැපකිරීමත් උත්සාහයත් තියෙනව නම් ඔබේ මුදල් නිවැරදිව කළමනාකරණය කරල සාර්ථකත්වයේ පළමු පියවර තබන්න ඔබටත් පුළුවන්. මූල්‍යමය විනයක් ඇති කරගන්න අපි යන ගමන ප්‍රධාන වශයෙන් කොටස් 4 ට බෙදන්න පුළුවන්.

ඒ තමයි,

- ඉතිරි කිරීම්
- ණය ගැනීම්
- ආයෝජනය
- ආරක්ෂණය

02

ඉතිරිය

1 ඔබට හොඳ ආර්ථික පදනමක් තියාගෙන පහසුවෙන් ජීවත් වෙන්න මූලික පදනමක් වෙන්නේ ඔබගේ ඉතුරු කිරීම්. පුරුද්දක් හැටියට ඔබට ලැබෙන ආදායමෙන් කොටසක් ඉතුරු කරන්න. ඒ වගේම ඔබේ වියදම අඩු කරගන්න පුරුදු වෙන්න. මතක තියාගන්න ලෝකේ දිනන්නේ හම්බ කරපු අය නෙමෙයි ඉතුරු කරපු අය කියල.

බලන්න ඔබත් ඉතුරු කරන්නේ මෙහෙමද කියල...

ආදායම - වියදම් = ඉතිරිය

කියල හිතනව නම් ඔබ නිවැරදි නැහැ.

ආදායම - ඉතිරිය = වියදම



කියල හිතනවා නම් ඔබත් හරි විදිහට ඉතුරු කරන්නෙක්

2 ඉතුරු කරන ප්‍රමාණය තීරණය කරන්න

ඔබට ලැබෙන මාසික වැටුපෙන් අවම වශයෙන් 10%ක් වත් ඉතුරු කරන්න කියන එක තමයි පිළිගත් සම්මතය. හැබැයි වැදගත් වෙන්නේ ඉතුරු කරන ප්‍රමාණයම නෙමෙයි, කොහොම හරි ඉතුරු කරන්න පටන් ගන්න එකයි.

ඔබ අද කීයක්වත් ඉතුරු කරන්නේ නැති වෙන්න පුළුවන්. හැබැයි අමාරුවෙන් හරි තීරණයක් ගන්න. ලබන මාසේ වැටුප ලැබුනට පස්සේ නියමිත ගණනක් ඉතුරු කරන්න. එතකොට ඔබේ අතේ මුදලක් ඉතුරුවන ගමන්ම, වියදම් ප්‍රමාණයත් නිසි පරිදි පාලනය වේවි.

3 හදිස්සියකට ගන්න සල්ලි ටිකක් තියලා තියන්න

මේක එක පාරටම කරන්න ටිකක් අමාරුයි. නමුත් කීය කීය හරි ඉතුරු කරලා හදිස්සියකට ගන්න සල්ලි ටිකක් තියෙන එකේ වැදගත්කම නම් කියල නිමකරන්න අමාරුයි. ඔබ අවිවාහක නම් මාසික වියදම් වගේ තුන් ගුණයක් හෝ විවාහක, දරුවන් හා යැපෙන්නන් සිටින අයෙක් නම් මාසික වියදම් මෙන් 3 ගුණයත් 6 ගුණයත් අතර මුදලක් හදිසි අවශ්‍යතාවක් වෙනුවෙන් වෙන්කර තබාගන්න.

4 ඉතිරි කරන මුදල ක්‍රමයෙන් වැඩිකරගන්න

ඔබගේ වියදම් අඩු කර ගන්න එක මේ සඳහා ගොඩක් උපකාර වෙනවා. ඒ සඳහා අපගේ 'ඉතුරු කරන මග' බලන්න.

එහෙමත් නැත්නම් මේ සඳහා උපකාරී වෙන තවත් විදිහක් තමයි ඔබගේ ආදායම වැඩිකර ගැනීම. ඒක ක්‍රම කිහිපයකටම කරන්න පුළුවන්. එකක් තමයි අමතර ආදායම් මාර්ගයක් හොයාගන්න එක. තමන්ගේ පුද්ගල සංවර්ධනය තුලින් හෝ අමතර සුදුසුකම් ලබා ගැනීමෙන් තමා කරන රැකියාවෙන් ඉහලට යාම තවත් විදිහක්ය.

5 තමන්ට ලැබෙන ආදායමෙන් උපරිම ප්‍රයෝජන ගන්න.

සාමාන්‍යයෙන් ඔබ මුදල් ඉතිරි කිරීමේ ගිණුමකට බැර කරනවා වෙන්න පුළුවන්. නමුත් ඔබේ මුදල් වලට වැඩි ප්‍රතිලාභයක් ලබාදෙන තැනක එය ආයෝජනය කිරීමෙන් ඔබට ආදායමෙන් උපරිම ප්‍රයෝජන ගන්න පුළුවන්.

6 ගිණුම් රැසක් තබා ගැනීමෙන් වළකින්න.

ඔබේ ඉතුරුම් සඳහා වෙනම ගිණුමකුත් එදිනෙදා ගනුදෙනු සඳහා වෙනම ගිණුමකුත් වශයෙන් ගිණුම් දෙකක් පවත්වා ගෙන යාම ඔබේ ආදායම කළමණාකරණයට විශාල රුකුලක් වේවි.

ගිණුම් වර්ගය	හේතුව	විශේෂාංග සහ ඔබට ලැබෙන ප්‍රතිලාභ
ගනුදෙනු ගිණුම	◉ ඔබේ ආදායමෙන් ඔබට මාසය පුරා වියදම් වන ප්‍රමාණය දැන ගැනීමට ◉ වියදම් ඉතා පහසුවෙන් කළමනාකරණයට	◉ හැකිනම් ජංගම ගිණුමක් ◉ නීත්‍ය නියෝග පහසුකම් ◉ ඩෙබිට් කාඩ්පතක් ◉ රටපුරා පැතිරුණු අප ATM ජාලයක් ඔබගේ බැංකු කටයුතු පහසු කර ගැනීමට අමතර වේලාවක් සේවය කරන බැංකු ශාඛා ◉ 24 පැය පාරිභෝගික සේවාව ◉ අන්තර්ජාල බැංකු පහසුකම
ඉතුරු කිරීමේ ගිණුම	◉ මාස්පතා කලින් තීරණය කල මුදල් ප්‍රමාණයක් ඔබේ ආදායමෙන් ඉතුරු කිරීමට	◉ උපරිම ප්‍රතිලාභ (පොළිය) ◉ ඔබගේ ඉතුරුම් ඉහල නංවන අනෙකුත් ප්‍රතිලාභ

06

ආදායම් වියදම් ගැන

සල්ලි වලට මොකද උනේ? ආදායම් වියදම් ගැන බිඳක්...

සමහර වෙලාවට අපි කොච්චර සල්ලි හම්බ කලත් ටික දවසක් යනකොට අපිම දන්නෙ නැහැ සල්ලි වලට මොකද උනේ කියලා. එහෙම වෙනවයි කියන්නේ තත්වය ටිකක් භයානකයි කියන එක. කණගාටුවෙන් උනත් කියන්න වෙනව එහෙම වෙනව නම් ඔබ ආදායම් හා වියදම් පිළිබඳ හරි ආකාරයෙන් වාර්තා තියාගන්න කෙනෙක් නම් නෙමෙයි.

08

ආදායම් වියදම් හොයාගන්නේ මෙහෙමයි...

වැටුප හෝ වෙනත් ආදායම් වශයෙන් ඔබට ලැබුණු මුළු මුදල (බදු අඩු කල පසු) නිවැරදිව සටහන් කරගන්න.

★ ඔබගේ ක්‍රෙඩිට් කාඩ් ප්‍රකාශන, බැංකු ණය ප්‍රකාශන, මෑතකදී මිලදී ගත් භාණ්ඩ වල බිල්පත් සහ ජල, විදුලි වැනි බිල්පත් වගේම පවුලේ අමතර වියදම් සියල්ලත් නිවැරදිව සටහන් කර එකතු කරගන්න.

ඔබේ ආදායම් සියල්ලේ එකතුවෙන් ඉතුරුම් අඩුකර ඉන් වියදම් සියල්ල අඩුකරගන්න.

★ මෙහිදී ඔබට ලැබෙන්නේ සෘණ අගයක් නම් ඔබේ වියදම් ගැන නැවත සිතා බලන්න කාලේ හරි. අත්‍යවශයම දේ හැර අනෙකුත් වියදම් ඉතා ඉක්මනින් නැවැත්වීම හෝ අඩුකරගැනීමට දැන්ම පටන් ගන්න.

★ ආදායමෙන් වියදම් අඩු කල පසු ඔබට මුදලක් අතඉතුරු වෙනවා නම් ඔබ සාර්ථකත්වයේ පලමු පියවර තබන කෙනෙක් එහෙම නම් ඔබේ ජීවිතයේ ඉලක්කයන් සපුරා ගන්න එම මුදල නිවැරදි ලෙස ආයෝජනය කරන්න දැන්ම පටන් ගන්න.

ඊළඟ පිටුවල තියෙන සරල වගු ඒ සඳහා ඔබට උපකාර වේවි.

පහත දැක්වෙන වගුවන් ඔබේ ඉතුරුම් ප්‍රමාණය කල් පිරුණු පසු ඔබට ලැබෙන මුදලත් නියමිත කාලයකට පසු ඔබට අවශ්‍ය මුදල ලබා ගැනීමට මාස්පතා ඉතුරු කලයුතු මුදලත් දැකගත හැක.

අවුරුදු 1	මාසික ඉතුරුම් ප්‍රමාණය	1,0000.0	5,000.00	8,000.00	100000	12000.00	15000.00
2		12532.93	62664.63	100263.40	125329.26	150395.11	187993.88
3		26106.08	130530.39	208848.62	261060.78	313272.93	391591.17
4		40805.79	204028.97	326446.36	408057.95	489669.54	612086.92
5		56725.58	283627.91	453804.65	567255.81	680706.97	850883.72
6		73966.70	369833.51	591733.62	739667.02	8876000.42	1109500.53
7		92638.83	463194.14	741110.62	926388.27	1111665.93	1389582.41
8		112860.73	564303.65	902885.84	1128607.30	1354328.76	1692910.95
9		134761.04	673805.20	1078088.32	1347610.40	1617132.48	2021415.60
		158479.07	792395.33	1267832.52	1584790.66	1901748.79	2377185.98
10		184165.68	920828.38	1473325.40	1841656.75	2209988.10	2762.485.1

උදා : ඔබ මාස්පතා රු. 8,000 බැගින් ඉතුරු කලහොත් අවුරුද්දක් අවසානයේදී ඔබට රු. 100,263.40 මුදලක් ලබා ගත හැක.

★ පොළී අනුපානය 8%ත් ලෙස උපකල්පනය කර ඇත.

10

LOAN APPLICATION FORM
About You
Ref No:
APPROVED
address and post code

ණය ගැනීම්

ණයක් ලබා ගැනීමට බලපාන හේතු කිහිපයක්.

- ඔබ ඉතුරු කල මුදල් වලින් සැලසුම් කල කාර්යයන් කිරීමට නොහැකි වූ විට හිඟ මුදල පියවා ගැනීමට
- හොඳ ප්‍රතිලාභ ලබා දෙන ආයෝජන අවස්ථාවක් උදා වූ විට ඒ සඳහා මුදල් යෙදවීමට
- බලාපොරොත්තු නොවූ හදිසි මුදල් අවශ්‍යතාවකදී

1. වාරිකය ගෙවීමට ඇති හැකියාව සලකා බලා ඒ අනුව ණය ගන්න

ඔබ ණයක් ගැනීමේදී ඔබේ අවශ්‍යතාවය ගැන හිතනවා වගේම ඒ මුදල නැවත ගෙවන විදින පිළිබඳවත් සැලසුම් කරන්න. මොකද ඒ ණය මුදල කලට වේලාවට ගෙවුවොත් විතරයි කවද හරි දවසක ආයෙත් ඔබට ණය මුදලක් පහසුවෙන් ගන්න ලැබෙන්නේ.

2. අවශ්‍ය ප්‍රමාණයට පමණක් ණය ලබාගන්න

මතක තියාගන්න සෑම විටම ඔබේ අවශ්‍යතාවයේ ප්‍රමාණයට පමණක් ණය ලබාගන්න. ඔබ වැඩිපුර ණය ලබා ගැනීමෙන් ඔබේ වැඩිපුර මුදල් ප්‍රමාණයක් බොහෝ විට නිකරුනේ වියදම් වෙන්න පුළුවන්. එමගින් ඔබට අනවශ්‍ය ණය බරක් දරන්න සිදුවෙන්න පුළුවන්.

3. ණය සහ ආදායම පිළිබඳ අනුපාතය

මේ වගේ අනුපාතයක් ගැන කතා කරන්න හේතුව තමයි. අපි ණය මුදලක් ගත්තට පස්සේ ඒක ආපහු ගෙවන්න මුදල් වෙන්කල පසුව අපේ එදිනෙදා ජීවිතය හොඳින් පවත්වාගෙන යන්න මුදල් අපි ළඟ තිබිය යුතු වීම පිළිගත් සම්මතයක් හැටියට කියන්නේ අපේ ආදායමෙන් 36% ක් හෝ ඊට අඩු ප්‍රමාණයක් ණය වශයෙන් ගෙවන්න වෙන් කරන්න පුළුවන් කියලයි.

4. ණය මුදලක් අයදුම් කිරීමේදී මතක තබා ගත යුතු වැදගත් කරුණු කිහිපයක්

හැකිතාක් දුරට කලින් සඳහන් කරන ලද ආදායම් සහ ණය අතර අනුපාතය (Debt Service Ratio) හොඳ මට්ටමක පවත්වා ගෙන යන්න.

ණය ගැනීමේදී හැමවිටම අදාල බැංකුව හෝ මූල්‍ය ආයතනයට ඔබේ නිරවද්‍ය සහ වලංගු තොරතුරු ලබා දෙන්න.

5. ණය තොරතුරු වාර්තාව (CRIB Report) ගැන උනන්දු වන්න

මේක ඇහුවම සමහර වෙලාවට ඔබ ටිකක් බය වෙන්නත්, කලබල වෙන්නත් පුළුවන්. නමුත් ඔබ ණය මුදල් නිසි පරිදි ආපසු ගෙවන කෙනෙක් නම් ණය තොරතුරු වාර්තාව ඔබට නැවත ණයක් ලබා ගැනීමට විශාල පිටිවහලක් වනු ඇති. ඒ වගේම ඔබ ණය මුදල් නිසි පරිදි ආපසු නොගෙවන අයෙක් නම් ඒ සියළු තොරතුරුත් විශේෂයෙන් ඒ වාර්තාවේ සඳහන් වන නිසා නැවත ණය මුදලක් ලබා ගැනීමේදී ඔබට සීමාවන් සහ අපහසුතාවයන්ට මුහුණ දීමට සිදුවේවි.

සමහර විට ඔබ ඇපකරුවෙකු වශයෙන් අත්සන් කල අයෙකු ණය මුදල නියමිත පරිදි නොගෙවනවා නම්, එයත් ඔබගේ ණය තොරතුරු වාර්තාවට අහිතකර බලපෑමක් ඇති කරනවා. එම නිසා අවුරුද්දකට එක් වතාවක් වත් ඔබගේ ණය තොරතුරු වාර්තාව ලබා ගැනීම ඉතා වැදගත්.

ඔබට මෙම වාර්තාව ලබා ගැනීමට 0112 13 13 13 අංකයෙන් ශ්‍රී ලංකා ණය තොරතුරු කාර්යංශය ඇමතීමෙන් පුළුවන්.

6. නියමිත පරිදි ආපසු ගෙවීම

ණය මුදලක් ගත් පසු නියමිත වාරිකයේ ප්‍රමාණය මෙන්ම නියමිත දිනට එය ගෙවීමත් ඉතා වැදගත්. ඔබගේ කාර්ය බහුලතාවය නිසා නැවත ගෙවීම අතපසු වන්නේ නම් ස්ථාවර නියෝගයක් මගින් ණය වාරිකය නැවත ගෙවීමට අණකිරීම ඉතා සුදුසු දෙයක්. නැතහොත් ඔබ වැටුප් ලබන්නෙක් නම්, ඔබගේ වැටුප අදාල ණය මුදල ලබාගත් බැංකුවට හෝ මූල්‍ය ආයතනයට යොමුකිරීමත් සුදුසු ක්‍රියාවක්.

7. ණය ආරක්ෂණ රක්ෂණයක් ලබා ගැනීම

හදිසි ආපදාවක් අපට කොයි වෙලේ ඇති වෙයිද කියල කාටවත් කියන්න බැහැ. එවැනි අවස්ථාවකදි ඔබට ඇතිවන ණය වාරිකය ගෙවීමේ අපහසුතාවය ණය ආරක්ෂණ රක්ෂණයක් ලබා ගැනීම තුලින් මගහැර ගන්න පුළුවන්. මන්ද එබඳු අවස්ථාවකදී සම්පූර්ණ ණය මුදල රක්ෂණ ආයතනය මගින් පියවන නිසා.

ණය ගැනීම් වර්ග කිහිපයක් සහ වැදගත් කරුණු #1

ණය වර්ගය	උපයෝගීතාවය	සලකා බැලිය යුතු කරුණු
ණය පත් Credit Cards	හදිසි වියදම් පියවා ගැනීමට. මෙමගින් පොළී රහිත වාරික සහ වෙනත් විශේෂ මිල අඩුකිරීමේ පිරිනමයි.	ඔබේ මාසික වියදම් වලින් පිටත එදිනෙදා භාවිතය සඳහා යොදා නොගන්න. හදිසි මුදල් අවශ්‍යතා සඳහා යොදාගන්නේ නම් හැකි තරම් ඉක්මනින් එම මුදල ගෙවා නිමකරන්න. අනෙකුත් ණය වලට වඩා පොළී අනුපාතය ඉතා ඉහළ අගයක් ගනී. රජයේ බදු ප්‍රමාද ගාස්තු, දඩ පොළී ආදී ගාස්තු අය කෙරේ.
පුද්ගලික ණය Personal Loans	ඔබේ අවශතාවයක් සඳහා මුදල් ලබා ගත හැක.	පුද්ගලික ණය මුදලක් ලබා ගැනීමේදී පොළී අනුපාත ගැන සැලකිළිමත් වෙන්න ඔබට වඩාත් ගැළපෙන්නේ වෙනස් වන පොළී අනුපාතයක්ද (Variable) නැත්නම් ස්ථාවර පොළී අනුපාතයක් (Fixed) දැයි තීරණය කරන්න.

ණය ගැනීම් වර්ග කිහිපයක් සහ වැදගත් කරුණු #2

ණය වර්ගය	උපයෝගීතාවය	සලකා බැලිය යුතු කරුණු
ලීසිං Leasing	ලියාපදිංචි කල හෝ නොකල වාහන හෝ යන්ත්‍ර සූත්‍ර මිලදී ගැනීමේදී අදාල වේ. ඔබ අත තිබෙන මුදල් යම් භාණ්ඩයක් මිලදී ගැනීමට ප්‍රමාණවත් නොවන අවස්ථා වලදී හිඟ මුදල ලබා ගැනීම සදහා යෝග්‍ය වේ.	පොළී අනුපාතය සහ කොන්දේසි පිළිබද සැලකිළිමත් විය යුතුයි.
නිවාස ණය Home Loans	ඔබේ සිහින නිවස ඉදිකිරීමටත් නිවාස අළුත්වැඩියා කටයුතු සඳහා වෙන්ම ඉඩම් මිලදී ගැනීමටත් ලබාගත හැක.	නැවත ගෙවීමට අවු 20 වැනි ඉතා දිගු කාලසීමාවක් ලබාදේ. ඔබේ ගෙවීමේ හැකියාව අනුව ණය ලබා ගන්නා කාලය පිළිබඳ සැලකිළිමත් වීම අතිශය වැදගත්ය. දිගු කාලීන නිවාස ණයක් නැවත ගෙවීමේදී වාරිකයක් සුළු වශයෙන් වැඩි වුවත් එමඟින් නැවත ගෙවන කාල සීමාවේ පැහැදිලි අඩු වීමක් සිදුවේ නම් එය ඔබට ඉතා වාසිදායක බැවින් ඒ පිළිබඳ සැලකිලිමත් වන්න

16

ආයෝජනය

ආයෝජනයක් යනු කුමක්ද?

ඇත්තටම එය හරිම සරලයි. ලේසිම විදිහට කියනවනම් ආයෝජනය කියලා කියන්නේ මුදල් හම්බ කරන්න මුදල් යොදවන එකයි. එහෙම නැත්නම් සල්ලි හම්බ කරන්න තියෙන වෙනස් විදිහක් තමයි ආයෝජනය.

රැකියාවේ දියුණුව එහෙමත් නැති නම් ව්‍යාපාරයේ දියුණුව අපේ ආදායම් තත්වය වැඩි දියුණු කරනවා. ඊට අමතරව අපේ ආදායම් සහ වත්කම් වැඩි කරගැනීමට නියෝජිතයෙක් අප වෙනුවෙන් වැඩ කරන්න යොදවන්න පුළුවන් නම් ඉතා යෝග්‍යයි. ඒ නියෝජිතයා තමයි අපේ මුදල් අප වෙනුවෙන් වැඩ කරන්න යොදවන්නේ.

ආයෝජන අවස්ථාවන් මොනවාද?

- කොටස් වෙළඳපල
- ආයෝජන බැඳුම්කර
- භාණ්ඩාගාර බිල්පත්
- ඉතිරි කිරීමේ හෝ ස්ථාවර තැන්පතු
- ඉඩම් සහ දේපොළ ආයෝජනය
- නව ව්‍යාපාර ආරම්භය
- රත්‍රං
- ඒකක භාර (*Unit Trust*) කොටස් වෙළෙඳ පොල
- භාණ්ඩාගාර බිල්පත්, ආයෝජන බැඳුම්කර, ඉතිරි කිරීමේ ගිණුම්

අපි ආයෝජනය කල යුත්තේ ඇයි?

ඇත්තටම බැලුවොත් හැමෝටම ඕන වැඩියෙන් සල්ලි හම්බ කරන්න. තමන්ගේ මූල්‍යමය නිදහස වැඩිකරගන්න හෝ මූල්‍යමය ස්ථාවරත්වය ඇති කරගන්න වගේම ජීවිතයේ තමන්ට අවශ්‍ය දේ නිදහසේ මිලදී ගැනීමේ හැකියාව ඇති කරගන්න බොහෝ දෙනා ආයෝජනය සඳහා පෙළඹෙනවා.

අවදානමේ සහ ආදායමේ සම්බන්ධය

ආදායම සහ අවදානම අතර තියෙන්නේ ඉතාමත් සමීප සම්බන්ධයක්. ඔබ අලුත් ව්‍යාපාරයක් ආරම්භ කිරීම වැනි වැඩි අවදානමකින් කරන ආයෝජනයකින් බලාපොරොත්තු විය හැකි ආදායමත් ගොඩක්ම වැඩියි. ඒ කියන්නේ වැඩි අවදානමක් දරන ආයෝජනයකින් තමයි වැඩි ප්‍රතිලාභ බලාපොරොත්තු වෙන්න පුළුවන්.

ඉතිරි කිරීමේ හෝ ස්ථාවර තැන්පතු වල මුදල් ආයෝජනය කිරීම වැනි අඩු අවදානමක් සහිත ආයෝජනවලින් ලැබෙන්නේ අඩු ප්‍රතිලාභයක්. පහත දැක්වෙන ප්‍රස්ථාරයෙන් මේ සම්බන්ධය හොඳින් තේරුම් ගන්න පුළුවන්.



එකිනෙකට වෙනස් ආයෝජන සිදු කිරීම (විවිධාංගීකරණය) වැදගත්...

මෙතෙන්දි මතක් වෙන්නේ ප්‍රසිද්ධ කියමනක්. ඒ තමයි "ඔක්කොම බිත්තර එකම බඳුනකට දමන්න එපා" කියන එක. එයින් දෙන අදහස වෙන්නේ, විවිධ ක්ෂේත්‍ර වල ඔබේ ආයෝජන සිදුකිරීමෙන් ඔබට අවදානම අඩු කරගන්න පුළුවන් වෙනවා කියන එක. මොකද ක්ෂේත්‍රයන් එකිනෙකට වෙනස් නිසා එකකින් ප්‍රතිලාභ අඩු උනත් අනෙකුත් ආයෝජන වලින් ප්‍රතිලාභ ලැබීමෙන් පාඩුව අවම කරගන්න පුළුවන්.

ආයෝජන විවිධාංගීකරණය ඇත්තටම කොටස් 3 කට බෙදන්න පුළුවන්.

1. විවිධ වත්කම් වල ආයෝජනය කිරීම.

2. එකිනෙකට වෙනස් වෙළෙඳපල වල සහ ප්‍රදේශ වල ආයෝජනය.

3. එකිනෙකට වෙනස් ආයෝජන උපක්‍රම අනුගමනය කිරීම.



ආයෝජන වර්ග කිහිපයක්....

ආයෝජනය සඳහා එකිනෙකට වෙනස් විධි තිබෙන බව අපි මීට පෙර සඳහන් කලා ඔබට මතක ඇති. ඔබට වඩාත්ම සුදුසු ආයෝජන වර්ගය කුමක්ද කියල දැනගන්න අපි දැන් ඒවා මොනවද කියල බලමු.



බැඳුම්කර

ස්ථාවර ප්‍රතිලාභයක් ලැබෙන සුරක්ෂිත ආයෝජනයක් විදිහට මෙය හඳුන්වන්න පුළුවන් සාමාන්‍යයෙන් ඔබ බැඳුම්කරයක් මිලදී ගැනීමේදී රජයට හෝ සමාගමකට ඔබේ මුදල් ගෙවිය යුතුයි. නියමිත කාලය සම්පූර්ණ වු පසු අමතර පොළියක් සමග ඔබ ගෙවූ මුදල ආපසු ලබා ගත හැකියි.

විකල්ප ආයෝජන

බැඳුම්කර හා කොටස් යන මූලික ආයෝජන වර්ග දෙකට අමතරව විකල්ප ආයෝජන රාශියක් අපි අතර තියෙනවා. ඒ අතරින් Unit Trust, රත්තරන්, ඉඩම් සහ දේපල වෙළඳාම් යන ආයෝජන වලට හිමි වන්නේ ප්‍රධාන තැනකි.

ඔබ ආයෝජනයට නවකයෙක් නම් විකල්ප ආයෝජන ගැන ඒ තරම් නොහිත ඉන්න එක ඇඟට ගුණයි. මොකද විකල්ප ආයෝජන බොහෝ විට වැඩි අවදානමකින් යුක්ත නිසා.

කෙටියෙන් කරුණු කිහිපයක්

- සෑම ආයෝජනයකටම අවදානමක් ඇති බව තේරුම් ගැනීම.
- වැඩි අවදානමක් දරන ආයෝජන වැඩියෙන්ද අඩු අවදානම් ආයෝජන අඩුවෙන්ද ප්‍රතිලාභ ලබා දෙන බව.
- විවිධ ක්ෂෙත්‍ර වල ආයෝජනයෙන් අවදානම අවම කරගත හැකි බව.
- ඔබේ ආයෝජනයේ නියම ප්‍රතිලාභ ලැබේදැයි තක්සේරු කර බැලීම වැදගත්.
- එය ඊළඟට ඔබ දකින සුරක්ෂිතම හා අවදානම්ම ආයෝජනයේ ප්‍රතිලාභය සමඟ සසඳා බැලීමත් වැදගත්.
- ද්‍රවශීලතාවය කියන්නේ ආයෝජනය කොතරම් ඉක්මනට මුදල් බවට පත්කරගන්න පුළුවන්ද කියන එකයි.
- ද්‍රවශීලතාවයේ වැදගත්කම තීරණය වෙන්නේ ඔබ ආයෝජනය කරන කරුණ හෝ ඔබේ අරමුණ අනුවයි

ද්‍රවශීලතාවය පිළිබඳ පහත උදාහරණය බලන්න.

හදිසි අවශ්‍යතාවයකට ගැනීමට තිබෙන මුදලක් බැංකුවෙහි තැන්පත් කිරීම ඉතා සුදුසුයි. එම මුදලෙන් ඉඩමක් මිලදී ගතහොත් අවශ්‍ය වේලාවට එම මුදල ඔබට ලබාගන්නට නොහැකි වේවි.

ආරක්ෂණය

ආරක්ෂණය යනු කුමක්ද?

ආරක්ෂණය යන්නෙන් අදහස් කරන්නේ අපට මුදල් උපයා දෙන මාර්ගයන් අනපේක්ෂිත අවදානම් වලින් සුරක්ෂිත ද යන්නයි.

උදාහරණ -

- රැකියාවෙන් වැටුප් ලබන අයෙක් ලෙස අනපේක්ෂිත පූර්ණ සහ තාවකාලික අකර්මන්‍ය තත්වයකට පත් වුවහොත් ඉන් අපගේ රැකියාව අහිමි වීම අනිවාර්යයයි. එවැනි අවස්ථාවකදී කිසියම් මුදලක් ලැබෙන අයුරින් රක්ෂණයක් අප සතුද?

- අප කුලියට දී ඇති නිවසක් ඇති නම් එය ගිනි හා ස්වභාවික උවදුරු වලින් රක්ෂණය කර ඇතිද?

ඔබේ විශ්‍රාම අරමුදලේ ප්‍රමාණය ඔබම තීරණය කරන්න

- විශ්‍රාම ගන්නා දිනය තීරණය කරන්න.
- විශ්‍රාමික ජීවිතයේ ඔබ ලැබිය යුතු වාර්ෂික/මාසික ආදායම තීරණය කරන්න.
- දැනට ඔබ සතුව පවතින ඉතිරි කිරීම් සහ ආයෝජනවල වර්තමාන වටිනාකම ගණනය කරන්න.
- විශ්‍රාම ගන්නා වයස වන විට ඒ සඳහා ලැබිය හැකි වාර්ෂික ප්‍රතිලාභ තීරණය කරන්න.
- ඔබගේ අනෙකුත් රාජ්‍ය අරමුදල් (EPF & ETF) මගින් ලැබෙන ප්‍රතිලාභ ප්‍රමාණය ඉහත අගයට එකතු කර වාර්ෂික හෝ මාසික විශ්‍රාමික ආදායම තීරණය කරන්න.

  - විශ්‍රාම අරමුදල් සැලසුම් කිරීමේදී වාර්ෂික උද්ධමනය පිළිබඳව සැලකිලිමත් වන්න.
  - හැකිතාක් කලින් විශ්‍රාම දිවිය සැලසුම් කිරීම හා ඒ සඳහා ක්‍රියා කිරීම සාර්ථක විශ්‍රාම දිවියක මූලික පදනම බව සිහි තබා ගන්න.
  - ඔබේ වටිනා විශ්‍රාමික අරමුදල් සුරක්ෂිත හා ස්ථාවර ආයෝජන සඳහා පමණක් යොදවන්න.

වැඩි පොළිය හෝ ප්‍රතිලාභ ලබා දෙන බව පවසමින් නොයෙකුත් මූල්‍ය ආයතන විවිධ ප්‍රචාරණයන් සිදුකලත් එවැනි දේට හසු නොවී ඔබේ මුදල් යෙදවීමට පෙර ආයතනයේ ඉතිහාසය සහ මූල්‍ය ස්ථාවරභාවය පිළිබඳ හොඳින් සොයා බලන්න. බොහෝ විට වැඩි ප්‍රතිලාභ සමග වැඩි අවදානමද රැඳී ඇති බව සිහි තබාගන්න.

විශ්‍රාම ජීවිතයේ හමුවන පහත දැක්වෙන බාධක මග හරින්න.

- ඔබගේ විශ්‍රාම ජීවිතය සඳහා වෙන්කර තිබෙන ආයෝජන හෝ අරමුදල් කලින් භාවිතා නොකරන්න.

- උදාහරණයක් වශයෙන් ඔබ සේවක අර්ථසාධක අරමුදලෙන් නිවාස ණය මුදලක් ලබා ගන්නේ නම්, එම ණය මුදල නිසි පරිදි ගෙවා දමන්න. එසේ නැතහොත් ඔබගේ ණය මුදල පොළියත් සමගින්ම අර්ථ සාධක අරමුදලෙන් අඩුවී යනු ඇති.

- එමෙන්ම ඔබේ විශ්‍රාම දිවියේදී වැඩියෙන් වියදම් කර අඩුවෙන් ඉතුරු කිරීමෙන් වලකින්න. එයද ඔබගේ විශ්‍රාම අරමුදල් ශේෂයෙන් අඩු වී යාමට ප්‍රධාන හේතුවක් වනු ඇත.

- ඔබට කොතරම් විශ්‍රාම අරමුදල් තිබුනද ඒවායින් වියදම සඳහා ප්‍රමාණවත් මුදල් නොලැබීම තවත් ප්‍රධාන ගැටළුවකි. එනිසා සැමවිටම ඔබේ වියදමට ප්‍රමාණවත් මුදලක් ලැබෙන අරමුදල් වල පමණක් ආයෝජනය කරන්න

- විශ්‍රාමික සමයේදී බරපතල රෝගාබාධ ඇතිවීමෙන් ඔබේ සියළුම ආයෝජනයන් නැති වි යාම ද සිදුවිය හැක. එනිසා එම ප්‍රතිලාභ සහ අරමුදල් නිසි ලෙස පවත්වා ගෙන යාමට සුදුසු රක්ෂණාවරණයක් ලබා ගැනීමට අමතක නොකරන්න.

NDB බැංකුව

අනාගත බැංකුකරණයේ පෙරගමන්කරු

වැඩි විස්තර සඳහා අමතන්න 011 244 8888